Wondershare
PDFelement

සියළුම හිමිකම් ඇවිරිණි

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

වෘත්තීය දැනුම ඇගයීමේ පරීක්ෂාව- 2022 අප්‍රේල්

වැඩබිම් සුපරීක්ෂක

ජාතික වෘත්තීය සුදුසුකම - 4 වන මට්ටම

කාලය පැය 03

විභාග අපේක්ෂකයන් හට උපදෙස්

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 50 දක්වා වූ ප්‍රශ්නවල , දී ඇති (a), (b), (c), (d) උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න
- මෙම ප්‍රශ්න පත්‍රයෙහි පිටු 07 ක් අඩංගු වේ.

---

1 කොටස

1. ගොඩනැගිල්ලක යටිගැටුම (Substructure) අර්ථ ගැන්වීම වන්නේ;
   a) D .P.C මට්ටමේ සිට බිත්ති යටලීය දක්වා
   b) D .P.C මට්ටමේ සිට පළමු මහල් තට්ටුව දක්වා
   c) D .P.C මට්ටමට පහළින් ඇති කොටස
   d) D .P.C මට්ටමේ සිට ජනේල පහල මට්ටම දක්වා

2. මෙහි දැක්වෙන අත්තිවාරම් වර්ගය වන්නේ;
   a) තීරු අඩිතාලම (Strip)
   b) පහුරු අඩිතාලම (Raft)
   c) ඒකාබද්ධ අඩිතාලම (Combined footing)
   d) තනි අඩිතාලම (Isolated footing)



3. අත්තිවාරම සඳහා වඩාත්ම නිවැරදි අර්ථකථනය වන්නේ;
   a) ව්‍යුහයේ භාරය යටිපසට සම්ප්‍රේෂණය කරයි.
   b) භාරය, මතුපිට පසට සමානව බෙදාහරියි
   c) උඩුහැටුම (superstructure) ඉදිකිරීමට මට්ටම් කළ තද මතුපිටක් ලබාදෙයි.
   d) විශාල ප්‍රදේශයකට භාරය බෙදා හරියි.

4. සක්ක ගල් බැම්ම සඳහා වඩාත් සුදුසු ගල්වල ගුණාංගයක් වන්නේ;
   a) සැහැල්ලු බව
   b) දැඩි බව
   c) බර බව
   d) තද බව

5. ස්ථිර තද පසක් සැළකිය යුතු ගැඹුරකින් පිහිටා ඇත්නම්,වඩාත් සුදුසු වැඹ අත්තිවාරම වන්නේ;
   a) අග ඉසිලුම් වැඹ (End Bearing)
   b) ඝර්ෂණ වැඹ (Friction tiles)
   c) විස්තාපන වැඹ (Displacement)
   d) ආදේශන වැඹ (Replacement)

6. කොන්ක්‍රීට් ඝණක පරීක්ෂණය සඳහා භාවිතා කරන අච්චුවේ ප්‍රමාණය වන්නේ;
   a) 150mm X150mm X 150mm
   b) 100mm X 100 mm X 100mm
   c) 300 mm X 300mm X 300mm
   d) 150mm X 100mm X 150mm

Wondershare PDFelement

7. ගඩොල් බිත්ති බැඳීමකදී වළක්වා ගත යුතු වන්නේ;
   a) සිරස් මූට්ටු
   b) තිරස් මූට්ටු
   c) Queen closer
   d) Brick bats

8. පිරිසිදු හුණු පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ;
   a) එය කෙටි කාලයක් තුළ ශක්තිය ලබා ගනී
   b) එය දැඩි වීමට කෙටි කාලයක් ගතවේ
   c) එහි ශක්තිය වර්ධනය කිරීමට බොහෝ කාලයක් ගත වේ
   d) ගඩොල් නිෂ්පාදනය සඳහා එය අමු ද්‍රව්‍යයක් ලෙස භාවිතා කරයි

9. රූප සටහනේ දක්වා ඇති බැමි වර්ගය වන්නේ;
   a) බඩගල් බාන්දුව
   b) ෆ්ලෙමිෂ් බාන්දුව
   c) ඉංග්‍රීසි බාන්දුව
   d) ඔළුගල් බාන්දුව



10. ඇස්ෆොල්ට් (Assault) කොන්ක්‍රීට් අතුරනයන්/තට්ටු සුසංහසනය සඳහා වඩාත්ම යෝග්‍යවන මාර්ග තලනය වන්නේ;
   a) තණ්ඩල (Tandem) 8- 10 Toner තලනය
   b) බැටළු පා තලනය
   c) කම්පන තලනය
   d) වායව ටයර (Pneumatic Tyre) තලනය

11. ගඩොල් බැම්මක් ඉදිකිරීමකදී භාවිතයවන තාක්ෂණික ක්‍රමයක් වන්නේ;
   a) දත් පැන්නුම (Toothing) - පඩි පැන්නුම (Stepping)
   b) දත් පැන්නුම (Toothing) - කැපීම (Cutting)
   c) බඩගල් බාන්දුව (Stretcher bond) - ඔලුගල් බාන්දුව (Header bond)
   d) පඩි පැන්නුම (Stepping) - කැපීම (Cutting)

Wondershare PDFelement

12. ප්‍රාථමික වැඩ යන්නෙහි වඩාත් නිවැරදි පිළිතුර වන්නේ;
   a) මතුපිට පස් තට්ටුව කපා දමා ඉවත් කිරීම
   b) භූමියේ ඉදිකිරීම් සඳහා අවසර ලබා ගැනීම
   c) ඉදිකිරීම් සඳහා අවශ්‍ය මූලික පහසුකම් ලබා ගැනීම හා භූමිය සකස් කිරීම
   d) භූමිය වටා ආරක්ෂිත වැටක් ඉදි කිරීම

13. දෘඪ (Rigid) මාර්ග ඇතිරුමක් වඩාත් සුදුසු වන්නේ;
   a) අධි වේගී මාර්ග හා A කාණ්ඩයේ මාර්ග වලට
   b) මුහුදු බඩ මාර්ග වලට
   c) වියළි කලාපයේ නව මාර්ග වලට
   d) තෙත් කලාපයේ පටු මාර්ග වලට

14. මාර්ගයේ මතුපිට හා පැති කාණු පිරිසිදු කිරීම, වල්පැල ගැලවීම හා අතුගෑම අයත් වන නඩත්තුව වන්නේ;
   a) වාරික නඩත්තුව
   b) වාර්ෂික නඩත්තුව
   c) හදිසි නඩත්තුව
   d) නිතිපතා නඩත්තුව

Wondershare PDFelement

15. ප්‍රධාන ප්ලාස්ටික් වර්ග දෙක වන්නේ;
    a) රළු සහ සිනිඳු
    b) වර්ණ සහ අවර්ණ
    c) තාප ස්ථායී හා තාපප්ලාස්ටික්
    d) රළු සහ සුමුදු නිමාව

16. බැඳුම්කාරක ද්‍රව්‍ය වලින් සමන්විත වන කාණ්ඩය වන්නේ;
    a) මැටි, හුණු, සිමෙන්ති, තාර
    b) කපරාරු, තීන්ත, වීදුරු, දැව
    c) පිහන් මැටි, ලෝහ, ප්ලාස්ටික්, පරිවාරක
    d) කොන්ක්‍රීට්, ගඩොල්, වානේ, දැව

17. පසෙහි පීඩනය දරාගත හැකි ඉදිකිරීමක් වන්නේ;
    a) බෙදුම් බිත්ති (Partition Wall)
    b) ගැබියන් තාප්ප (Gabion Wall)
    c) කුහර බිත්ති (Cavity Wall)
    d) පනේල බිත්ති (Panel Wall)

18. ගවර /චූෂණ වල (Septic tank) යනු;
    a) වැසි ජලය එකතු කිරීම සඳහා මුද්‍රා තැබූ මැදිරිය
    b) අපජලය එකතු කිරීම සඳහා මුද්‍රා තැබූ මැදිරිය
    c) අපජල ප්‍රවාහය වෙනතකට හැරවීම සඳහා මුද්‍රා නොකළ මැදිරිය
    d) වැසි ජලය එකතු කිරීම සඳහා මුද්‍රා නොකළ මැදිරිය

19. මිලිමීටර් 10 ක විෂ්කම්භයක් සහිත රළු වානේ කම්බියක ස්කන්ධය (kg / m) වන්නේ;
    a) 0.616
    b) 0.222
    c) 0.888
    d) 1.579

20. කයිරු බැම්මක (plinth) සාමාන්‍ය උස වන්නේ;
    a) 50mm -100 mm
    b) 300mm- 500 mm
    c) 1000mm - 2000mm
    d) 300mm - 450 mm

21. DPC තෙත් නිවාරන වැටිය මගින් ගොඩනැගිල්ලක;
    a) වේයන් සංක්‍රමණය වළක්වයි
    b) තෙතමනය ඇතුළුවීම වළක්වයි
    c) ජලය ඇතුළුවීම වළක්වයි
    d) වැරගැන්නුම් මළකඩ කෑම වළක්වයි

22. මූලික වහළක් ලෙස හඳුන්වනු නොලබන්නේ ;
    a) දෙපල (Pitched) වහළ
    b) පැතලි (Flat) වහළ
    c) කබොළු (Shell) වහළ
    d) ගේබල (Gable) වහළ

23. වඩිම්බු ලෑල්ලක් සවි කිරීමේ අරමුණ වනුයේ;
    a) වහලේ සෙවිලි තහඩු රුවා යෑම වැළැක්වීම
    b) බාජු ලෑල්ලට ආධාරකයක් ලෙසින්
    c) පිටත බිත්ති වලට ජලය ඉසීම වළක්වාලීමට
    d) වැහි පීලි සවිකිරීමට ආධාරකයක් ලෙස

Wondershare
PDFelement

24. දක්වා ඇති රූප සටහන් අතරින් දැව වන්නේ;

a) A
b) B
c) C
d) D



25. වැඩබිමක මට්ටම් කිරීමට අදාළ වැඩ අයිතම වන්නේ;

a) එළි පෙහෙළි කිරීම, ඇඹරීම සහ ඉවත් කිරීම, අගල් කැපීම
b) පස් ඉවත්කිරීම, ගොඩ ගැසීම
c) කැපීම හා පිරවීම, කපා ඉවත්කිරීම හා පිරවීම
d) විවෘත වල කැපීම, ගැඹුරු ළිං / වළවල් තැනීම

26. කණු හා තට්ටුවේ අතර වැර ගැන්නුම් පිලිබඳ වැඩබිමේදී නැවත පරීක්ෂා කිරීමට ඔබට අවශ්‍ය නම් ඔබ විසින් අදිනු ලබන්නේ;

a) දළ සැලසුමකි
b) ස්ථානීය සැලසුමකි
c) සංකල්පිත සැලසුමකි
d) කාර්යය සැලසුමකි

27. ඇල මාර්ගයේ කැණීම සඳහා මිනුම් කලයුතු වර්ගඵලය වන්නේ;

a) $lh + ah^2$
b) $\frac{1}{2}(lh + ah^2)$
c) $lh + \frac{1}{2}ah^2$
d) $(l + h)^2 a$



28. අභ්‍යන්තර මානයන් 4500 x 3000 mm සහිත කාමරයක් ටයිල් කිරීම සඳහා අවශ්‍ය 300 x 300 mm බිම් උළු ගණන වන්නේ;

a) 100 Nos
b) 200 Nos
c) 150 Nos
d) 75 Nos

29. යාන්ත්‍රික සූරනය (Mechanical scraper) වඩාත්ම සුදුසු වන්නේ;

a) කාණු කැපීමට
b) ලොරියකට බඩු පැටවීමට
c) විශාල ප්‍රදේශයක මට්ටම් අඩු කිරීමට
d) වැඩබිමෙහි පස් විසුරුවාලීමට

30. භූමි මිණුම්කරණයේදී ගන්නා මූලික මිණුම් වන්නේ;

a) තිරස් හා කෝණික
b) රේඛීය හා කෝණික
c) සිරස් හා කෝණික
d) තිරස් හා රේඛීය

31. මට්ටම් ගැනීමට අවශ්‍ය උපකරණ වන්නේ;

a) මිනුම් උපකරණය, ටේප් පටිය, රිට හා බංකු ලකුණ
b) මිනුම් උපකරණය, තෙපාව, කුඩය හා බංකු ලකුණ
c) මිනුම් උපකරණය, තෙපාව, රිට හා සලකුණු කාරකය
d) මිනුම් උපකරණය, ටේප් පටිය, කුඩය හා රිට

Wondershare
PDFelement

32. තීන්ත වලට ආදේශක එක් කිරීම පිළිබඳව වඩාත්ම නිවැරදි වගන්තිය වන්නේ;
   a) තීන්ත ස්ථරයක ඒකාකාර බව පවත්වාගෙන යාමට
   b) ප්‍රයිමරය හා තීන්ත අතර යහපත් බැඳීමක් ඇති කිරීමට
   c) බුරුසු ලකුණු අවම කිරීමට
   d) තීන්ත ස්ථරයේ ඇති පැලීම් හා අල්පෙනෙති හිල් අවම කිරීමට

33. අපවාහන නළ පද්ධතියක ඇති මෙම අංගය වන්නේ;
   a) S උගුල
   b) P උගුල
   c) බෝතල් උගුල
   d) නළ මූට්ටුව



34. අත් උපකරණ පිලිබඳ නිවැරදි වගන්තිය වන්නේ;
   a) තාක්ෂණ ශිල්පියාගේ උපකරණ පට්ටියේ, අත් උපකරණ රැඳවිය යුතුය.
   b) අඩු ඉස්කුරුප්පු නියන ආදිය ඇණ මුරිච්චි සඳහා භාවිත කල යුතුය.
   c) වානේ මිටියකින් තද වානේ තලයකට පහර දිය යුතුය
   d) ගමන් කේබලය කැපීමට ඉතා තියුණු පිහියක් භාවිත කල යුතුය.

35. වැඩ බිමක අනතුරු ඇතිවීමට බොහෝවිට පාදක වන හේතුව වන්නේ;
   a) නොසැලකිල්ල
   b) පුහුණුවක් නොමැතිකම
   c) කාර්යය බහුල වීම
   d) මෙවලම් භාවිතයේ ඇති නොදනුවත්කම

Wondershare
PDFelement

36. විදුලි කාන්දුවක් නිසා හටගන්නා ගින්නක් නිවා දැමීමට භාවිත කරන ගිණි නිවනය වන්නේ;
   a) ජලය
   b) වියලි රසායන ද්‍රව්‍ය
   c) කාබන් ඩයොක්සයිඩ්
   d) පෙණ

37. වැඩබිමක රැස්වෙන ස්ථානය (assembly point) යනු;
   a) සේවකයන් නවාතැන් ගන්නා ස්ථානය
   b) ආපදාවකදී ඉවත් කිරීමෙන් පසු මිනිසුන් එකතුවන ස්ථානය
   c) වැඩබිමේ ආගමික වතාවත් කරන ස්ථානය
   d) විවේක ගන්නා නිදහස් ස්ථානය

38. ගලි ඉදිකරනු ලබන්නේ ;
   a) මළ අපද්‍රව්‍ය එකතු කිරීමට
   b) රසායනික අපද්‍රව්‍ය එකතු කිරීමට
   c) වැසි ජලය එකතු කිරීමට
   d) උණු ජලය බෙදා හැරීමට

39. ව්‍යාපෘතියක ප්‍රමාදය හඳුනා ගැනීමට භාවිතය කළහැකි ලේඛනය වන්නේ;
   a) වැටුප් වාර්තා
   b) ඉදිකිරීම් සැලැස්ම
   c) මුදල් ප්‍රවාහ වාර්තා
   d) වැඩබිමෙහි ඇති ද්‍රව්‍ය වාර්තා

Wondershare
PDFelement

40. සතිපතා ප්‍රගති වාර්තාව පිළිබඳව වඩාත් සුදුසු පැහැදිලි කිරීම වන්නේ;
   a) සතිඅග රැස්වීම් සඳහා උපකාරවේ.
   b) දිනපතා විස්තර වාර්තාවල සාරාංශකි.
   c) සතිපතා රැස්වීම් වල වාර්තා සාරාංශ ගත කරයි.
   d) කම්කරු පැමිණීම් පමණක් පෙන්වයි.

41. රසායනික උපද්‍රව කාරකයක් වන්නේ;
   a) ඉන්ධන ඉහිරීම
   b) වැටීම
   c) විදුලිය
   d) ආශ්‍රාහණය

42. සුදුසුකම්ලත් පුද්ගලයකු විසින් වැඩබිමෙහි ඇති පලංචි පරික්ෂා කල යුතු වන්නේ;
   a) කාර්තුවකට වරක්
   b) මසකට වරක්
   c) සතියකට වරක්
   d) දිනපතා

43. පරික්ෂා සහතිකයක් අත්‍යවශ්‍ය වන අධි අවදානම් යන්ත්‍රෝපකරණය වන්නේ;
   a) විදුම් යන්ත්‍රය
   b) කම්බි නැවුම් යන්ත්‍රය
   c) අටලු (කණු) දොඹකරය
   d) කපන යන්ත්‍රය

44. වැඩ බිමකදී ලබා දිය හැකි ප්‍රථමාධාරයක් වන්නේ;
   a) නාසයේ සිරවූ දෙයක් ඉවත් කිරීම
   b) තුවාලයකට බෙහෙත් දැමීම
   c) දැඩි පිළිස්සුම් සඳහා තෙල් ආලේපය
   d) ඇසේ තුවාල සඳහා බෙහෙත් බිංදු දැමීම

45. වැඩබිම්වලින් සැපයෙන සාමාන්‍ය සුබසාධන පහසුකම් වන්නේ;
   a) පුහුණු වැඩසටහන් හා ආහාර
   b) වාසස්ථාන හා සනීපාරක්ෂක පහසුකම්
   c) ක්‍රීඩා හා විවේක පහසුකම්
   d) වෘත්තීය සමිති ක්‍රියාකාරකම්

46. සේවකයකුට අයිති විවේක කාලය සතියක් සඳහා වන්නේ;
   a) දින 1.5
   b) දින 2
   c) දින 1
   d) දින 2.5

47. වැඩබිමක අනතුරක් සිදුවිය හැකි කරුණක් විය හැක්කේ;
   a) පරිපාලනය දෝෂ නිසා
   b) අතින් හැසිරවීම නිසා
   c) අවශ්‍ය ආලෝකය නැති වීම
   d) වැඩි ශබ්දය නිසා

48. පඩි පාලක ආඥාපනත අනුව සතියකට අදාල අතිකාල පැය ගණන ගැණිය හැක්කේ;
   a) වැඩ පැය 30 කට පසුව
   b) වැඩ පැය 36 කට පසුව
   c) වැඩ පැය 42 කට පසුව
   d) වැඩ පැය 48 කට පසුව

49. සන්නිවේදනයේ දී ආයතනික බාධාවක් වන්නේ;
- a) නවීන තාක්ෂණය මත අසීමිත ලෙස යැපීම
- b) සමාජීය ක්‍රියාකාරකම්
- c) ශ්‍රම බලකායේ කාර්යක්ෂමතාවය පවත්වා ගෙන යෑම
- d) කම්කරු, ආරවුල් විසඳීමේ දී ඉදිරිපත් වීම

50. දෛනික වාර්තා පවත්වා ගෙන යන්නේ;
- a) ආයතනයේ ක්‍රියා පිළිවෙත් හා පටිපාටි ආවරණය කිරීමට
- b) නිම කළ කාර්යයන් පිළිබඳ වාර්තා කිරීමට
- c) ද්‍රව්‍ය භාවිතය නිරීක්ෂණය කිරීමට
- d) එක් එක් අයගේ කාර්ය සාධනය නිරීක්ෂණය කිරීමට

(01 x 50 =ලකුණු 50)

Wondershare PDFelement

Wondershare PDFelement

සියළුම හිමිකම් ඇවිරිණි

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
වෘත්තීය දැනුම ඇගයීමේ පරීක්ෂාව- 2022 අප්‍රේල්
වැඩබිම් සුපරීක්ෂක
ජාතික වෘත්තීය සුදුසුකම - 4 වන මට්ටම

කාලය පැය 03

විභාග අපේක්ෂකයන් හට උපදෙස්

- පළමු (01) ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න. (පළමු (01) ප්‍රශ්නය අනිවාර්ය වන අතර පිළිතුරු ලබාදිය යුතු මුළු ප්‍රශ්න ගණන හතරක් (04) විය යුතුය).
- මෙම කොටස සඳහා පිළිතුරු සැපයීම සඳහා ප්‍රශ්න පත්‍රයේ දී ඇති ඉඩ භාවිතා කරන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයෙහි පිටු 09ක් අඩංගු වේ.

---

2 කොටස

1.

i). නොගැඹුරු අත්තිවාරම් දෙකක් (02) නම් කරන්න.

(ලකුණු 01)

ii). Grade 20 හා Grade 25 කොන්ක්‍රීට් වල මිශ්‍රණ අනුපාත පිළිවෙලින් සඳහන් කරන්න.

(ලකුණු 01)

Wondershare PDFelement

iii). අත්තිවාරම් වර්ගයක් තෝරාගැනීමේදී සැළකිය යුතු මූලික කරුණු මොනවාද?

(ලකුණු 01)

iv). කම්බි වගුවක **20R 10 – 05 -150B** ලෙස සඳහන්ව ඇත. එයින් අදහස් වන්නේ කුමක්ද?

(ලකුණු 01)

Wondershare PDFelement

v). ශ්‍රී ලංකා දැව සංස්ථා වර්ගීකරණයට අනුව, සුපිරි සුඛෝපභෝගී පන්තියට අයත්වන දැව වර්ග දෙකක් (02) නම් කරන්න.

(ලකුණු 01)

vi). කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ ප්‍රධාන ක්‍රම දෙක (02) මොනවාද?

(ලකුණු 01)

vii). පොළව කැණීම සඳහා අතින් කැණීම් හා යන්ත්‍ර භාවිතයෙන් කැණීම උපයෝගී කරගනී. එම එක් එක් අවස්ථා වලදී ඇති වාසි හා සීමාවන් වලට එක් උදාහරණයක් බැගින් දෙන්න.

(ලකුණු 01)

Wondershare PDFelement

viii). බිත්ති අලංකරණයේදී භාවිතය වන ඉදිකිරීම් ද්‍රව්‍යයන් දෙකකට (02) උදාහරණ දෙන්න.

(ලකුණු 01)

ix). කොන්ක්‍රීට් දැමීමේදී සැටියම මගින් කෙරෙන මූලික කාර්යයන් මොනවාද?

(ලකුණු 01)

Wondershare PDFelement

x). ඉදිකිරීම් වලදී ඉතා වැදගත් වන "මිනුම්කරණය" හා "මට්ටම් ගැනීම" වෙන්කර විස්තර කරන්න.

(ලකුණු 01)

xi). කොන්ක්‍රීට් මිශ්‍රකල වහාම, එය ඇකිලීමට භාජනය වේ. එයට හේතු වන්නේ කුමන ක්‍රියාවලියද?

(ලකුණු 01)

xii). පෙනේර විශ්ලේෂණය මගින් බලාපොරොත්තු වන අරමුණු මොනවාද?

(ලකුණු 01)

Wondershare PDFelement

xiii). සුනම්‍ය (Flexible) මාර්ග ඇතිරිල්ලක් සඳහා වාරිකව කෙරෙන නඩත්තුවකදී කරන කාර්යයන් මොනවාද?

(ලකුණු 01)

xiv). මාර්ගයක මුහුණත හැඩය (camber) අත්‍යවශ්‍ය වන්නේ ඇයි?

(ලකුණු 01)

Wondershare PDFelement

2.

i). කොන්ක්‍රීට් වල සුමු කිරීම (batching), මිශ්‍ර කිරීම හා ප්‍රවාහනය විස්තර කරන්න.

(ලකුණු 05)

ii). සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති බදාමයක් උදෑසන අටට පමණ මිශ්‍ර කරන ලදුව, ඉන් කොටසක් භාවිතයට ගන්නා ලදී. සවස දෙකට පමණ ඉතිරිය ජලය සමඟ නැවත මිශ්‍ර කර භාවිතයට සූදානම්ව තිබිණ. ඔබ එය අනුමත කරන්නෙහිද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 04)

Wondershare PDFelement

iii). ගඩොල් බිත්ති බදාමයකට හා ඇතුලත බිත්ති කපරාරුවකට එකම වැලි වර්ගය භාවිතය කළ හැකිද? වෙනස් වන්නේ නම්, හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 03)

Wondershare PDFelement

3. පලංචි, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිතර භාවිතා වන අතර ඒ සඳහා විවිධ ක්‍රම යොදා ගනියි.

i). පලංචි යනු කුමක්ද? ඒ සඳහා භාවිතය කරන ද්‍රව්‍යයන් සඳහා උදාහරණ දෙන්න. එක් එක් උදාහරණ වල ඇති වාසි හා අවාසි විස්තර කරන්න.

(ලකුණු 06)

ii). පලංචි සිටුවීමේදී සැළකිලිමත් වියයුතු කරුණු මොනවාද?

(ලකුණු 03)

Wondershare PDFelement

iii). තීන්ත ගාන ලද ලෝහමය පෘෂ්ඨයක් මතුපිට දැකිය හැකි දෝෂයන් තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 03)

Wondershare PDFelement

4.

i). පැරණි ගොඩනැගිල්ලක් නඩත්තු කිරීමේදී ඔබ මුහුණපාන ප්‍රධාන තාක්ෂණික ගැටළු මොනවාද? ඔබ ඒවා විසඳා ගන්නේ කෙසේද?

(ලකුණු 05)

ii). ඉදිකිරීමක මට්ටම් දෙකක් සම්බන්ධ කිරීමට හා ඒවා අතර එහා මෙහා යාමට පඩිපෙළ භාවිතා කෙරේ. පහසුවෙන් ගමන්කිරීමට පඩිපෙළක තිබිය යුතු අවශ්‍යතා විස්තර කරන්න. .

(ලකුණු 07)

Wondershare PDFelement

Wondershare
PDFelement

5.

i). **Elbows** හා **bends** ජලනළ සවිකිරීම් වලදී සුලභව භාවිතය කරන අවස්ථා මොනවාද? ඒ දෙක අතර ඇති වෙනස්කම් විස්තර කර, ඒවායේ ඇති වාසි හා අවාසි පහදන්න.

(ලකුණු 05)

ii). ඔබගේ කොම්පැණියේ නවතැන් ගනිමින්, සේවය කරන සේවකයෙකු කොවිඩ් 19 ලක්ෂණයන් පළකරන්නේ නම්, ඔබ විසින් ගන්නා ක්‍රියා මාර්ග විස්තර කරන්න.

Wondershare
PDFelement

(ලකුණු 04)

iii). කොන්ක්‍රීට් කණු ඉදිකිරීමකදී පාපිල්ල පෙට්ටි (Kicker box) භාවිතය කරන්නේ ඇයි?

(ලකුණු 03)

Wondershare
PDFelement

6. තෙමහල්, පිරිමි නේවාසිකාගාරයක් ගොඩනැගෙමින් පවතින අතර, සනීපාරක්ෂක පහසුකම් ගොඩනැගිල්ලේ දෙකෙලවර පිහිටි ගේබල් බිත්ති අද්දරව ඉදිකෙරේ. සෑම මහලකම දෙකෙළවරෙහි, එක් කෙළවරක ජලමුද්‍රිත වැසිකිළි (WC) දෙකක් (02), මූත්‍ර කුටි (urinal) දෙකක්, (02) මුහුණ සෝදන බේසම් දෙකක් (02) හා නාන කුටි දෙකක් (02) බැගින් ඇත.

   i). එක් කෙලවරක ඇති මෙම අපවාහන පද්ධතියට අයත්වන ඒකක, කොටස්, සවිකිරීම් හා උපාංග ලැයිස්තුවක් සපයන්න.

(ලකුණු 04)

   ii). තෙවන මහලේ සිට පොලව බිම් මට්ටමේ ඇති මනුහිල (Manhole) දක්වා සියළු අපජලය හා අපද්‍රව්‍ය ප්‍රවාහනය කෙරෙන පද්ධතියේ කටු සටහනක් අඳින්න. කොටස් නම් කරන්න.

(ලකුණු 06)

Wondershare
PDFelement

   iii). ජල සම්පාදන ජාලයක ඇති කපාට දෙකක් (02) නම් කරන්න.

(ලකුණු 02)

Wondershare PDFelement

7. පහත සඳහන් මාතෘකා අතරින් තුනක් (03) තෝරා කෙටි සටහන් ලියන්න

(04 x 3 = ලකුණු 12)

i) වහළ සිවිලිම
ii) Trail pits
iii) දැව පදම් කිරීම
iv) මාර්ගවල ඇතිවිය හැකි දෝෂ

Wondershare PDFelement